# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2150/68 - 2019 නොවැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2019.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය :* 3/3/6/2/24.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

අධික වර්ෂාව හා නායයාම හේතුවෙන් අවතැන්වූවන්ට විකල්ප ඉඩම් ලබාදීම සඳහා ඉඩම් අත්කර ගැනීම (ගම් පුළුල් කිරීම යටතේ).

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොහොන්සියපත්තුව සුළු කොට්ඨාසයේ එනසල්මඩ ග්‍රාම නිලධාරි වසමේ එනසල්මඩ ගමේ පිහිටි මාතලේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මු. පි. මා. 1698 දරන පිඹුරේ සඳහන් හෙක්ටයාර් 1.6387ක් වූ කැබලි අංක 01 දරන ඉඩම.

ඉඩමේ නම: එනසල්මඩවත්ත; හිමිකම් කියන අය: රාජ්‍ය වැවිලි සමාගම, අංක 11, ඩියුක් වීදිය, කොළඹ 01;

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 දෙසැම්බර් මස 18 වැනි දින පෙ. ව. 10.30ට උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි. තවද, 2020 ජනවාරි මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්. එන්. කේ. සේරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
උකුවෙල.

2019 නොවැම්බර් මස 14 වැනි දින,
උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-140

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G31548 – 17 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.